[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 06 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

01). නිවස හැරුණු විට ඔබට වඩාත් හුරු පුරුදු පරිසරය වන්නේ,

1). පන්සලයි  2). ආරෝග්‍ය ශාලාවයි

3). ඔබේ පාසලයි  4). පුස්තකාලයයි.

02). ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය,

1). පළාතයි  2). දිස්ත්‍රික්කයයි

3). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි  4). ග්‍රාම නිලධාරි කොට්ඨාසයයි

03). බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන,

1). දෙකකි  2). තුනකි  3). හතරකි  4). පහකි

04). පහත සඳහන් කරුණු අතුරින් පාසලෙන් සමාජයට සැපයෙන සේවාවක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1). පාසල සතු දේපළ ආරක්ෂා කිරීම.

2). පාසලේ සංවර්ධන කටයුතු සඳහා සහාය වීම.

3). යහපත් පුරවැසියන් බිහි කිරීම.

4). පාසලේ විවිධ උත්සව කටයුතු සඳහා සහභාගි වීම.

05). තම දුර්වලතා අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයකි.

1). තම දුර්වලතා හඳුනා ගැනීම

2). අනුන්ගේ දුර්වලතා පෙන්වා දීම

3). අනුන්ගේ දුර්වලතා හඳුනා ගැනීම

4). තම දුර්වලතා පිළි නොගැනීම



LIVEWORKSHEETS

**අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06). සෑම දරුවකුම සුවිශේෂී දරුවෙකි. ( )

07). ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වූයේ නන්දදාස කෝදාගොඩ මහතා ය. ( )

08). ජීවිතයට සැලසුමක් අත්‍යවශ්‍ය නොවේ. ( )

09). නීති ගරුක වීම ඔබේ ගෞරවය ආරක්ෂා වීමට හේතු වේ. ( )

10). මානව සම්පත විධිමත්ව පුහුණු කිරීමෙන් ආර්ථික වාසි සැලසේ. ( )

**( ලකුණු 2 ✗ 10 = 20)**

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11). පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ .................... තුළින් ප්‍රකාශ වේ.

12). යහපත් ............................ නිසා පාසල සමාජයට විවෘත වේ.

13). මිනිසා තම කායික හැකියා හා .............................. හැකියා වර්ධනය කර ගැනීම නිසා මානව සම්පතක් බවට පත්වේ.

14). භෞතික සම්පත් මඟින් මිනිසාට ලැබෙන මෙහෙය අතිමහත්ය. එනිසා ඒවා .............................. කළ යුතුය.

15). සෑම පුද්ගලයකුටම ජීවිත ................................ වලට මුහුණ දීමට සිදුවේ.

( මානසික, අභියෝග, ආවේණික, ප්‍රජා සබඳතා, දැක්ම, සංරක්ෂණය) **(ලකුණු 2 ✗ 5 = 10)**

**අංක 16 සිට 20 දක්වා A කොටසේ ඇති ප්‍රකාශයට ගැළපෙන ප්‍රකාශය B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16). ඔබේ පාසල ඉටු කරන මෙහෙය දැක්වේ. | A. වැටි බැඳීම |
| 17). පාසලේ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් හා පිළිගැනීම් | B. අයිතිවාසිකම් |
| 18). පාංශු රක්ෂණ ක්‍රමයකි. | C. සම්ප්‍රදායයන් වේ |
| 19). සම්පත් නැවත භාවිතා කිරීම | D. මෙහෙවර ප්‍රකාශය |
| 20). යුතුකම් ඉටු කිරීම තුළින් තහවුරු වේ. | E. ප්‍රතිචක්‍රීකරණය |

**(ලකුණු 2 ✗ 5 = 10)**



LIVEWORKSHEETS